තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිට දී ය

**එච්. එම්. සී. ඒ. ජයසිරි එ. නාගරික සංවර්ධන අධිකාරිය**

RTIC Appeal (**පුද්ගලික වශයෙන් විභාග කිරීම**) /**385** /**2018** (**2018.09.18** දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්:** පියතිස්ස රණසිංහ

**අභියාචක** - එච්. එම්. සී. ඒ. ජයසිරි
**නොතිසි ලත් පාර්ශවය** - අධ්‍යක්ෂ ජනරාල්, නාගරික සංවර්ධන අධිකාරිය

**පෙනීසිටීම**
අභියාචක - එච්. එම්. සී. ඒ. ජයසිරි
පොදු අධිකාරිය - ආර්.ටී.පී ජයසිංහ

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.01.02 |
| තොරතුරු නිළධර යා තීරණය ලබා දුන් දිනය | 2018.04.03 |
| නම් කල නිළධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.01.24 |
| නම් කල නිළධරයා තීරණය ලබා දුන් දිනය | පිළිතුරක් නැත |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2018.04.16 |

**අභියාචනයට පසුබිම්වූ කරුණු:**

අභියාචක 2018.01.02 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී,

1. *පොදු අධිකාරිය වෙත අභියාචක විසින් ලියාපදිංචි තැපැල් මගින් ඉදිරිපත් කළ පහත සදහන් ලිපිවල පොදු අධිකාරිය විසින් දමා ඇති රාජකාරි කාර්යාල සටහන් හා දින මුද්‍රාව ඇතුළත්වූ පොදු අධිකාරි ගොනුවේ පවතින ලිපිවල ඡායා පිටපත්, සහතික කර (සහතික පිටපත් යුනවෙන් සදහන් කර සහතික කරන නිලධාරියාගේ නම , නිලනාමය, මුද්‍රාව, දිනය සහ අත්සන ඇතුළත්ව),*

**a.** *අතිගරු ජනාධිපති තුමාට , පරිසර අමාත්‍ය තුමාට ,පළාත් පාලන අමාත්‍ය තුමාට සහ අධ්‍යක්ෂ (බස්නාහිර පළාත) මධ්‍යම පරිසර අධිකාරියට පිටපත් සහිතව ආරක්ෂක ලේකම් තුමා රාජ්‍ය*

ආරක්ෂක අමාත්‍යාංශයට හා සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) ජගත් රණවීර මහතාට නාගරික සංවර්ධන අධිකාරිය ඇමතූ 2012.01.03 දින ලිපිය, (ඇමුණුම 01)

b. අතිගරු ජනාධිපති තුමාට , පරිසර අමාත්‍ය තුමාට ,පළාත් පාලන අමාත්‍ය තුමාට සහ අධ්‍යක්ෂ (බස්නාහිර පළාත) මධ්‍යම පරිසර අධිකාරියට පිටපත් සහිතව අධ්‍යක්ෂ (බස්නාහිර පළාත) නාගරික සංවර්ධන අධිකාරිය ඇමතූ 2012.02.07 දින ලිපිය, (ඇමුණුම 02)

c. පොලිස් පති තුමාට අධ්‍යක්ෂ ජනරාල් තුමා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව , අධ්‍යක්ෂ ජනරාල් තුමා මධ්‍යම පරිසර අධිකාරිය සහ ස්ථානාධිපති තුමා පොලිස් ස්ථානය අවිස්සාවේල්ල වෙත පිටපත් සහිතව අධ්‍යක්ෂ (බස්නාහිර පළාත) නාගරික සංවර්ධන අධිකාරිය ඇමතූ 2012.07.04 දින ලිපිය, (ඇමුණුම 03)

d. අධ්‍යක්ෂ ජනරාල් රමණි අල්පොල මියට හා සහකාර පොලිස් අධිකාරීතුමාට පිටපත් සහිතව අධ්‍යක්ෂ (බස්නාහිර පළාත) නාගරික සංවර්ධන අධිකාරිය ඇමතූ 2012.07.14 දින ලිපිය,( ඇමුණුම 04)

e. අධ්‍යක්ෂ ජනරාල් රමණි අල්පොල මියට හා ලේකම් පරිසර අමාත්‍යාංශයට පිටපත් සහිතව අධ්‍යක්ෂ (බස්නාහිර පළාත) නාගරික සංවර්ධන අධිකාරිය ඇමතූ 2012.08.28 දින ලිපිය, (ඇමුණුම 05)

f. අධ්‍යක්ෂ ජනරාල් තුමිය වෙත අධ්‍යක්ෂ (බප) නාගරික සංවර්ධන අධිකාරිය වෙත පිටපත් සහිතව 2012.10.17 දින ලේකම් පරිසර අමාත්‍යංශය වෙත ඉදිරිපත් කල 2012.10.17 දින ලිපය, (ඇමුණුම 06)

g. නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ (බප) ඇතුළු ආයතන 31ක් වෙත ඉදිරිපත් කරන ලද 2013.03.15 දින ලිපිය (ඇමුණුම 07)

h. අතිගරු ජනාධිපති තුමාට, ආරක්ෂක ලේකම් තුමාට , ආර්ථික කටයුතු අමාත්‍ය තුමාට , සභාපති - මධ්‍යම පරිසර අධිකාරියට, පළාත් අධ්‍යක්ෂ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය දෙපාර්තමේන්තුවට , පළාත් අධ්‍යක්ෂ (බටහිර) සත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය දෙපාර්තමේන්තුව සහ සභාපති රණවිරු සේවා අධිකාරියට පිටපත් සහිතව නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති නිමල් පෙරේරා මහතා ඇමතූ 2013.05.27 දින ලිපිය, (ඇමුණුම 08)

i. අතිගරු ජනාධිපති තුමාට, පරිසර අමාත්‍ය තුමාට, ආරක්ෂක ලේකම් තුමාට, සභාපති නිමල් පෙරේරා මහතා නාගරික සංවර්ධන අධිකාරිය, අධ්‍යක්ෂ ජනරාල් තුමා මධ්‍යම පරිසර අධිකාරිය, අධ්‍යක්ෂ (බප) දේවිකා විතානගේ මිය මධ්‍යම පරිසර අධිකාරියට පිටපත් සහිතව , අධ්‍යක්ෂ ජනරාල් නිහාල් ප්‍රනාන්දු සහ සහකාර අධ්‍යක්ෂ ජනරාල් බ්‍රිගේඩියර් පේ .එම් .එස් එස් ජයසුන්දර මහතා නාගරික සංවර්ධන අධිකාරිය ඇමතූ 2013.08.18 දින ලිපය, (ඇමුණුම 09)

j. පරිසර අමාත්‍යාංශයේ හිටපු ලේකම් තුමාට (පිටපත් ක්‍රියායාකිරීමට), ජනාධිපති ලේකම් කාර්යාලයේ හිටපු ලේකම් මේධා බෙම්මුල්ල වෙත නාගරික සංවර්ධන අධිකාරියේ සහකාර අධ්‍යක්ෂ ජනරාල් වෙත , සත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (බටහිර) වෙත නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ (බප)/අධ්‍යක්ෂ (බලාත්මක) වෙත පිටපත් (ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා) සහිතව නියෝජ්‍ය කේ .එ .ච් මුතුතුඩආරච්චි මහතා පරිසර අධිකාරිය ඇමතූ 2013.09.08 දින ලිපිය, (ඇමුණුම 10)

k. අධ්‍යක්ෂ ජනරාල් නාගරික සංවර්ධන අධිකාරියට හා (මුපිනො) බොහෝ මුලස්ථාන වෙත පිටපත් සහිතව ලේකම් සීතාවකපුර නගර සභාව ඇමතූ 2015.12.07 දින ලිපිය, (ඇමුණුම 11)

l. අධ්‍යක්ෂ ජනරාල් නාගරික සංවර්ධන අධිකාරියට හා (මුපිනො) බොහෝ මුලස්ථාන වෙත පිටපත් සහිතව ලේකම් සීතාවකපුර නගර සභාව ඇමතූ 2016.0.28 දින ලිපිය, (ඇමුණුම 12)

m. අතිගරු ජනාධිපති තුමාට, පොලිස්පති පූජිත ජයසුන්දර මහතාට සහ ජනාධිපති තුමාගේ පුද්ගලික ලේකම් එරික් ප්‍රශන්න වීරවර්ධන මහතාට පිටපත් (ක්‍රියාකිරීමට) සහිතව පරිසර අමාත්‍යාංශ යේ ලේකම් උදය සෙනවිරත්තන මහතා , මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් කේ.එච් මුතුකුමාරණ මහතාට , නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් දුමිත් රත්නායක මහතාට, මධ්‍යම පරිසර අධිකාරියේ හිටපු අධ්‍යක්ෂ (බප) එම්. සිවකුමාර මහතාව ඇමතූ 2017.01.07 දින ලිපිය, (ඇමුණුම 13)

*n. අතිගරු ජනාධිපති තුමාට,ජනාධිපති තුමාගේ පුද්ගලික ලේකම් එරික් ප්‍රශන්න වීරවර්ධන මහතාට, ආරක්ෂක අමාත්‍ය තුමාගේ පුද්ගලික ලේකම් අසංක දොඩන්වල මහතාට ,පරිසර අමාත්‍යාංශයේ ලේකම් උදය සෙනවිරත්තන මහතාට, මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් කේ.එච් මුතුකුමාරණ මහතාට, මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් කේ.එච් මුතුකුමාරණ මහතාට,මධ්‍යම පරිසර අධිකාරියේ හිටපු අධ්‍යක්ෂ (බප) එම්. සිවකුමාර මහතාට පිටපත් (ක්‍රියාකිරීමට) සහිතව පරිසර අමත්‍යාංශයේ නීති නිලධාරිනි ලුම්බිණි කිරිඇල්ල මිය ඇමතූ 2017.01.21 දින ලිපිය, (ඇමුණුම 14)*

*o. අතිගරු ජනාධිපති තුමාට, ලේකම් තුමා පශු සම්පත් හා ප්‍රජාසංවර්ධන අමාත්‍යාංශයට , ලේකම් තුමා පරිසර අමාත්‍යාංශයට, සහකාර අධ්‍යක්ෂ ජනරාල් බ්‍රිගඩියර් ජේ . එම්. එස්. එස්. ජයසුන්දර මහතා නාගරික සංවර්ධන අධිකාරියට අධ්‍යක්ෂ (බටහිර) සත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය දෙපාර්තමේන්තුවට පිටපත් සහිතව අධ්‍යක්ෂ ජනරාල් මධ්‍යම පරිසර අධිකාරිය දින ඇමතූ 2013.11.12 ලිපිය (ඇමුණුම 15)*

***2.** ඉහත ලිපි සම්බන්ධයෙන් පොදු අධිකාරිය රාජකාරිමය වශයෙන් යම් ක්‍රියාමාර්ග ගෙන ඇත්නම් , එම ක්‍රියාමාර්ග ගත් ලිපි වල සහතික පිටපත්.*

තොරතුරු නිලධාරියා පනත ප්‍රකාරව නියමිත කාලය තුළ, පිළිතුරු සැපයීමට අපොහොසත් වූ බැවින් අභියාචක 2018.01.24 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධාරයාද පනත ප්‍රකාරව නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක 2018.04.16 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

එහෙත්, තොරතුරු නිලධාරියා 2018.04.03 දිනැතිව පිළිතුරු සපයමින් පහත තොරතුරු ලබා දී ඇත.

1. 2012.01.23 දින ආරක්ෂක ලේකම් තුමා සහ සහකාර අධ්‍යක්ෂ ජගත් රණවීර මහතා වෙත එවන ලද ලිපියේ සත්‍ය පිටපත,

2. 2012.03.04 දින අධ්‍යක්ෂ බස්නාහිර පළාත වෙත එවන ලද ලිපියේ සත්‍ය පිටපත,

3. 2012.10.17 දින පරිසර අමාත්‍යයංශයේ ලේකම් තුමිය වෙත ලද ලිපියේ සත්‍ය පිටපත,

4. 2013.03.15 දින අතිගරු ජනාධිපති, සියලු දේශපාලන නායකයින්, රජයේ වගකීම දරන උසස් නිලධාරීන් , සියලු මාධ්‍ය මුලස්ථාන වෙත යවන ලද ලිපියේ සත්‍ය පිටපත,

5. 2013.05.27 දින සභාපති නිමල් පෙරේරා වෙත යවන ලද ලිපියේ සත්‍ය පිටපත,

6. 2013.08.18 දින අධ්‍යක්ෂ නිහාල් ප්‍රනාන්දු මහතා සහ අධ්‍යක්ෂ ජනරාල් බ්‍රිගඩියර් ජේ. එම්. එස්. එස්. ජයසුන්දර වෙත යවන ලද ලිපියේ සත්‍ය පිටපත,

7. 2017.01.07 දින පරිසර අමාත්‍යයංශයේ ලේකම් උදය සෙනවිරත්න මහතා , මධ්‍යම පරිසර අධිකාරිය අධ්‍යක්ෂ ජනරාල් මුතුකුඩ ආරච්චි මහතා , නාගරික සංවර්ධන අධිකාරිය අධ්‍යක්ෂ ජනරාල් දුමිත් රත්නායක මහතා , මධ්‍යම පරිසර අධිකාරිය බස්නාහිර පළාත අධ්‍යක්ෂ එම් .සිවකුමාර මහතා වෙත යවන ලද ලිපියේ සත්‍ය පිටපත.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

තොරතුරු ඉල්ලීමේ අංක 1 අයිතමය සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීමේදී පොදු අධිකාරිය කියා සිටියේ 2018.09.11 දිනැති ලිපිය මගින් ඇමුණුම් 01,03,04,06,07,08,09, සහ 13 යනුවෙන් සඳහන්ව ඇති ලේඛණවල සත්‍ය පිටපත් අභියාචක වෙත ලබා දුන් බවයි.

තවදුරත් පොදු අධිකාරිය ඇමුණුම් 02, 05, 10, 11, 12, 14, සහ 15 යනුවෙන් සඳහන් ලේඛණ තම 'සන්තකයේ' නැති බව කියා සිටියේය .

තොරතුරු ඉල්ලීමේ අංක 2 අයිතමය සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීමේදී පොදු අධිකාරිය කියා සිටියේ, යම් ක්‍රියා *මාර්ග* ගෙන ඇත්නම් , එම ක්‍රියාමාර්ග ගත් ලිපි වල සහතික පිටපත් පොදු අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් විමසීමෙන් පසුව ඒ සම්බන්ධයෙන් වාර්ථාවක් අභියාවකට ලබා දිය හැකි බවයි.
**නියෝගය:**

නාගරික සංවර්ධන අධිකාරිය 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ප්‍රකාරව පොදු අධිකාරියකි. එම නිසා එහි විධිවිධාන අනුව කටයුතු කිරීමට නාගරික සංවර්ධන අධිකාරියට ව්‍යවස්ථාපිත වගකීමක් ඇත.

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතේ 3 (1) වගන්තිය මෙසේය,

> මේ පනතේ 5 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව, පොදු අධිකාරියක සන්තකයේ , භාරයේ හෝ පාලනයේ ඇති තොරතුරුවලට ප්‍රවේශ වීමේ අයිතිවාසිකම සෑම පුරවැසියකුටම තිබිය යුතුය.

ඒ අනුව,පොදු අධිකාරිය වෙතින් තොරතුරු ලබා ගැනීම සඳහා පුරවැසියාගේ අයිතිය පැන නගිනුයේ ඉල්ලා සිටින ලද තොරතුරු පොදු අධිකාරිය සන්තකයේ , භාරයේ හෝ පාලනයේ ඇති විටදී ය. තවද , තොරතුරු ඉල්ලීමේ අංක 1 අයිතමයේ ඇමුණුම් 02,05,10,11,12,14,සහ 15 යනුවෙන් සඳහන් ලේඛණ පොදු අධිකාරියේ 'සන්තකයේ නොමැති බව කරනු ලැබේ. තවද ,එම ලේඛන පොදු අධිකාරිය සන්තකයේ නොමැති බව තහවුරු කරමින් ලිපියක් සති දෙකක කාල සීමාවක් තුළ අභියාවකට ලබා දීමට පොදු අධිකාරිය වෙතනියෝග කරනු ලැබේ.

තොරතුරු ඉල්ලීමේ අංක 2 අයිතමය සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් වාර්ථාවක් කොමිෂන් සභාවට ඉදිරිපත් කිරමට නියෝග කරනු ලැබේ.

අභියාචනය මෙයින් කල් තබනු ලැබේ.

මීළඟ විභාග වාරය: 2018.11.13
*****